# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1711/23 - 2011 ජුනි 23 වැනි බ්‍රහස්පතින්දා - 2011.06.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය, දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන වන මම, එකී මණ්ඩලයට ආසියානු සංවර්ධන බැංකු ආධාර 6 ව්‍යාපෘතිය යටතේ යාපනය - කිලිනොච්චිය ජල සම්පාදන ක්‍රමයේ පුත්තූර් ජල කුළුණ ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අවශ්‍ය වී ඇති හෙයින්, අත්කර ගැනීමට යෝජිත මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය.

2011 ජුනි මස 14 වැනි දින,
අංක 35, නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/915.

**උපලේඛනය**

යාපනය දිස්ත්‍රික්කයේ කෝපායි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පුත්තූර් උතුර (J/274) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, පුත්තූර් උතුර ගමේ සුසාන භූමි ඉඩම නැමැති ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් හෙක්ටෙයාර් 0.06 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටසඃ-

| | | |
|---|---|---|
| *උතුරට* | ඃ | සුසාන භූමි ඉඩම ; |
| *නැගෙනහිරට* | ඃ | ගුරු පාර ; |
| *දකුණට* | ඃ | අත්කර ගන්නා ඉඩමේ ඉතිරි කොටස හා පුත්තූර් - චුන්නාගම් පාර ; |
| *බටහිරට* | ඃ | සුසාන භූමි ඉඩමේ ඉතිරි කොටස. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය ඃ* 01. සභාපති,
පුත්තූර් ප්‍රාදේශීය සභාව,
කෝපායි.

07-223

1A - G 14703 — 345 (2011/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.